ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1285/13 - 2003 අප්‍රේල් 24 වැනි බ්‍රහස්පතින්දා - 2003.04.24

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 21/78 වී

### 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25 අ වගන්තිය යටතේ කරනු ලබන නියෝගය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, තෘතියික අධ්‍යාපන හා පුහුණු අමාත්‍ය කබීර් හෂීම් වන මම, 1982 අංක 9 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සම්බන්ධයෙන් වාර්තාවක් එකී විශ්ව විද්‍යාල පනතේ 70ඇ වගන්තිය යටතේ ලබාගෙන ඇති හෙයින්, උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පාඨමාලාවල උපාධි ප්‍රදාන ආයතනයක් ලෙස මේ නියමය මගින් පිළිගනිමි.

#### උපලේඛනය

1. රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.
2. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.
3. රාජ්‍ය කළමනාකරණපති උපාධිය.

කබීර් හෂීම්,
තෘතියික අධ්‍යාපන හා පුහුණු අමාත්‍ය.

2003 අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ දීය.

05-170

1A-G 002565- 1, 050 (2003/04)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.